

# කතෘගෙන්

## අපේ ප්‍රධාන ආහාරය.....

"දියුණුව යනු වෙනස් වීමකි" යන කියමනේ වැදගත්කම අපේ ප්‍රධාන ආහාරය වන සහල් නිෂ්පාදනය කෙරෙහි යොමු කළ යුතු අවස්ථාව එළඹ ඇත. නවීන විද්‍යාවේ දියුණුව නැමැති මාවත ඔස්සේ ගමන් ගන්නා අපි නිතර අපේ ප්‍රධාන ආහාරය නිපදවීම ගැන හැම දිරියක්ම දැරිය යුත්තෝ වෙමු. මේ අරමුණ අනුව ජනතාවට අවශ්‍ය සහලින් රට ස්වයංපෝෂිත වනතෙක් වී ගොවිතැන පිළිබඳව කෙරෙන පර්යේෂණාත්මක කටයුතු විද්‍යාඥයෝ දිගටම කරගෙන යති.

අපේ විද්‍යාඥයින්ගේ නොපසුබට උත්සාහය නිසා ඔවුන්ගේ විමසිලි දැනුම උපයෝගී කරගෙන මෑතදී සොයාගත් අලුත් වී වර්ග කීපයක් නිසා මෙරට වී ගොවිතැනේ නව මුහුණුවරක පෙර නිමිති දැන් පහළ වී ඇත. මෙම වී වර්ග මඟින් 1976 වන විට අපට අවශ්‍ය මුළු සහල් ප්‍රමාණය නිපදවීමට බලාපොරොත්තු වේ. මෙතෙක් කල් අප වගා කළ වී වර්ග තුළද සෑහෙන අස්වැන්නක් දීමේ ශක්තියක් තිබුණි. එහෙත් කෙටි කලකදී වැඩි අස්වනු ලබනු පිණිස ඊටත් වඩා හොඳ වර්ග සෙවීමේ ප්‍රයත්නය නොනවතී.

අපේ ජනගහණය දිනෙන් දින වැඩි වන අතර, වගා කළ හැකි බිම් ප්‍රමාණය සීමා වෙයි. අපට වැලැක්විය නොහැකි මෙම සිදුවීම්වලටද මුහුණ දෙමින් ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීමේ ඒකායන මාර්ගය නම් වඩා දියුණු විද්‍යාත්මක ක්‍රම

අනුගමනය කිරීමය. ලාංකික ගොවියා ජාතිය වෙනුවෙන් දරනුයේ බලවත් වෙහෙසකි. ඔහු වැය කරන ශ්‍රමයෙන් බලාපොරොත්තු වන ඵල නෙලීමට ඇතැම්විට ඔහුට අවස්ථාවක් නොලැබෙනුයේ අපේ ගතානුගතික ගොවිතැන් ක්‍රමවල යම් යම් අඩුපාඩුකම් නිසාය. අපේ පැරණි ගොවි සංස්කෘතිය හෙලා දැකීම මෙයින් අදහස් නොකෙරේ. ඔහුගේ ශ්‍රමයට විද්‍යාත්මක ක්‍රම ඈතුල් වුවොත් අපට අවශ්‍ය ආහාර නිපදවීමට පමණක් නොව ලෝකයේ අන් කවර රටක ගොවීන් අතර වුවද නොදෙවෙනි තැනක් හිමිකර ගැනීමට ඔහුට හැකිවනු ඇත. මේ සඳහා මෑතකදී නිපද වූ නව වී වර්ග ගැන අපේ පාඨකයාගේ අවධානය මෙවර යොමු කරවීමට කැමැත්තෙමු.

විවිධ තත්ත්වයන් යටතේ මෙතෙක් කල් වගා කළ අනුමත වී වර්ග කීපයක් වෙනුවට අලුතින් බිහි කරන ලද නව වී වර්ග හයකි. මාස 4-4½ වර්ග වූ එච් 4 හා එච් 8 වෙනුවට වගා කළ හැකි බීජී 11-11, ඇල්ඩී 66, හා එම්අයි 273 ත්, මාස 3½ වයස් එච් 7 වෙනුවට වගා කළ හැකි බීජී 11-6 ත්, මාස 3 වර්ගයක් වූ පච්චෙයි පෙරුමාල් වෙනුවට වගා කළ හැකි බීජී 34-8 හා බීජී 34-11 ත් එම වර්ගයන් වේ.

වී වර්ගයක සාර්ථකත්වය මැනීමට උපයෝගී වන කරුණු කීපයකි. පැලෑටියේ වර්ධක සැලැස්ම, රසායනික පෝර ඇද ගැනීමේ හැකියාව, රෝගවලට ඔරොත්තු දීම හා සහල් ප්‍රතිශතයද ඉන් සමහරෙකි. මේවා පිළිබඳව මුලදී නිර්දේශ කළ වර්ග තුළ පිහිටි යම් යම් දුර්වලතාවයන්ගෙන් තොර හොඳ නිෂ්පාදන ශක්තියකින් යුත් මෙම වී වර්ග අප රට ගොවිපල් තුළ ලාංකික පර්යේෂණ නිලධාරීන්ගේ අතින්ම බිහිවීම අපට ආඩම්බර විය හැකි කරුණකි.

මේ වර්ග අතුරින් හැම පළාතකටම සුදුසු බීජී 11-11 පැල උදුරා සිටවීමෙන් සරු අස්වනු ලැබිය හැකි වර්ගයකි. ඇල්ඩී 66 ගාල්ල, කළුතර හා කොළඹ දිස්ත්‍රික්කවල මඩ කුඹුරුවල පැල උදුරා සිටුවීමට මෙන්ම වැපිරීමටද සුදුසුය. දිස්ත්‍රික් ගොවිකම් නිලධාරීන් මගින් ගොවීන්ට මේ බිත්තර වී සෑහෙන ප්‍රමාණයක් ලබාදීමට කටයුතු යොදා ඇත.

මෙම වර්ග පිළිබඳ අත්දැකීම් ලත් ගොවීන් කීප දෙනෙකු ගැන අපට දැනගන්නට ලැබුණි. "මීට වසරකට පෙර අක්කරයකින් බුසල් 30 ක් හෝ 40 ක් ලබාගත් මට දැන් බුසල් 100 ක් ලබාගැනීමට හැකිවී ඇත්තේ මෙම වර්ග නිසාය" යි පැවසුවේ කළුතර දිස්ත්‍රික්කයේ පළපුරුදු ගොවි මහතෙකි. "මාස 3 නව වී වර්ග වගා කිරීමෙන් පසුගිය පසළොස් වසර තුළදී මා ලත් බුසල් 40 ක පමණ අස්වැන්න මෙන් දෙගුණයක් ගැනීමට දැන් සමත් වී සිටිමි" යි මෙම නව වී වර්ග ගැන පැසසුවේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ තවත් ගොවි මහතෙකි. මෙම වර්ග වගා කරන අනෙකුත් ගොවි මහතුන් ද මෙවැනිම අත්දැකීම් ලබා ඇති බැව් නිසැකය. මෙම දියුණු වී වර්ග රට පුරාම ව්‍යාප්ත කිරීමට ගොවිකම් දෙපාර්තමේන්තුව දැනට යුහුසුළුව කටයුතු යොදා ගෙන යයි.

අළුත් වී වර්ගයක් බිහිකර එය ව්‍යාප්ත සේවයට පත් කරන තෙක් පර්යේෂණ නිලධාරීන් ඒ සඳහා දරනුයේ බලවත් වෙහෙසකි. සැබැවින්ම එය මිනිසාගේ කුස ගින්න නිවාලීම කෙරෙහි යෙදෙන සටනකි. විවිධ දේශගුණික පරිසරයන්, වෙනස් පස් වර්ග හා ලෙඩ රෝග ආදී අස්වැන්න සීමා කරන සාධකයන්ටද මුහුණ දෙමින් වැඩි අස්වැන්නක් ගත හැකි වී වර්ග නිපදවීමට ඔහුට සිදුවෙයි. ඒ අතින් බලන විට ඔවුන් අතින් නව වී වර්ගයක් බිහි වන්නේ ජාතිය සුරැකීමේ විශ්මිත දස්කමක් ද ඇතිවය. එවැනි වර්ගයකින් නිසි ඵල නෙලීමේ බලය රඳා ඇත්තේ අපේ ගොවි ජනතාවගේ දැතෙහිය. ඒ සඳහා නිතර ඔහුට දිරි දීමට ගොවිකම් ව්‍යාප්ති සේවය සූදානමින් සිටී. ඒ නිසා මෙම නව වී වර්ගවලින් බිත්තර වී ලබාගෙන දියුණු

ගොවිතැන් ක්‍රම අනුව වගා කර වැඩි අස්වනු ලබනු පිණිස ව්‍යාප්ති නිලධාරීන් හා කිට්ටුවෙන් කටයුතු කිරීමේ වැදගත්කම නැවත සිහිපත් කරවනු කැමැත්තෙමි.

බතේ අගය මෙන්ම බත නිපදවීමේ අගයද ලාංකික ජනතාවට අමුතුවෙන් හඳුන්වා දිය යුතු නොවේ. සරු පසකින් හා යහපත් පරිසරයකින් යුත් වාසනාවන්ත රටක ජීවත්වන අපට අපේ ආහාරය නිපදවා ගැනීමේ හැම පහසුවක්ම ඇත. නව සොයා ගැනීම් ද උපයෝගී කර ගනිමින් අපේ සහල් අපම නිපදවා ගැනීමට අදිටන් කර ගන්නා ලෙස අපගේ ගොවි ජනතාවට කරනු ලබන ආයාචනයකි මේ.

## පාඨකයිනි

අඩ සිය වසරකටත් අධික කාලයක සිට ගොවිකම් සඟරාව ඔබ අතට පත් කරනුයේ විද්‍යාත්මක ගොවිතැන පිළිබඳ නව දැනුමක් මෙරට විවිධ අංශවලට අයත් පාඨකයින්ට ලබාදීමේ අවංක අදහසිනි.

පාඨකයින්ගේ ද අදහස් අනුව ගොවි මහතුන්, වනිතාවන් හා පාසැල් සිසුන්ගේද දැනුම හා විනෝදය සඳහා සැකැසුණු නවාංග කීපයකින් යුතුව බිහිවන මේ සඟරාව කලට වේලාවට ලබා ගැනීමට අවශ්‍ය හැම පහසුකමක් ම සලසා ඇත.

වසරක දයක මුදල වූ රුපියලක් හෝ කලාපයක මිල වන ශත 30 ක් ඔබගේ පළාතේ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනට ගෙවීමෙන් හෝ පහත සඳහන් ලිපිනයට එවීමෙන් ඔබගේ සඟරාව ලබාගන්න :

ප්‍රධාන නිලධාරි (කෘෂිකර්ම ප්‍රවෘත්ති)
තැ. පෙ. 636,
කොළඹ 2.